# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 මැයි මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2023.05.18 දින නිකුත් කරන ලදී)**

## වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)

*(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)*

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉරාන් වික්‍රමරත්න මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 25.00 | තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

(අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශයන් ඉලෙක්ට්‍රොනික ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව ලබන්නා වූ ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික වත්කම් ප්‍රකාශ කිරීමේ පද්ධතියක් පිහිටුවීම සඳහා සහ නිශ්චිත තොරතුරු ප්‍රකාශවලින් ඉවත් කිරීමට යටත්ව, එම පද්ධතිය වෙත මහජනතාව විසින් ප්‍රවේශ වීමේ හැකියාව ලබාදීම සඳහා කොමිෂන් සභාව වෙත විධිවිධාන සැලැස්වීම මගින්;

(ආ) යම් පුද්ගලයකුගේ ශුද්ධ වත්කම් පූර්වයෙන් නිශ්චිත මුදලක් ඉක්මවනු ලබන අවස්ථාවක දී, වසරක කාලයක් තුළදී අතිවිශේෂ වත්කම් ප්‍රකාශ ගොනු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම මගින්;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා නිසි බලධරයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම මගින්;

(ඈ) නිශ්චිත තොරතුරු ප්‍රකාශවලින් ඉවත් කිරීමට යටත් ව, වත්කම් සහ බැරකම් ප්‍රකාශ වෙත මහජනතාව ප්‍රවේශ වීම සඳහා විධිවිධාන සැලැස්වීම මගින්;

(ඉ) වත්කම් සහ බැරකම් ප්‍රකාශවල පිටපත් මහජනතාව වෙත ඉදිරිපත් කිරීමේ දී ඉවත් කිරීමට නියමිත තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යතාවය පවත්වාගෙන යෑම සඳහා විධිවිධාන සැලැස්වීම මගින්;

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පමණක් හෝ කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පමණක් පනත ප්‍රකාරව නඩු කටයුතු පැවරීම සඳහා විධිවිධාන සැලැස්වීම මගින්; සහ

(උ) පනතට ආනුෂංගික සංශෝධන සිදු කිරීම මගින්,

මෙම පනත් කෙටුම්පත තුළින් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීම අපේක්ෂා කර සිටිනු ලැබේ.

## වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)

### ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය**

**1.** මේ පනත 2023 අංක දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1975 අංක 1 දරන පනතෙහි 2 වන වගන්තිය සංශෝධනය කිරීම**

**2.** 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2 වන වගන්තිය මඟින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (අ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(අඅ) ජනාධිපති;"

(2) (ඇඅ) ඡේදයේ "1981 අංක 20 දරන සංවර්ධන සභා (ඡන්ද විමසීම්) පනත" යන වචන ඉවත් කිරීමෙන්;

(3) (ඇඇ) ඡේදයේ "1981 අංක 20 දරන සංවර්ධන සභා (ඡන්ද විමසීම්) පනත" යන වචන ඉවත් කිරීමෙන්;

(4) (ඇඈ) ඡේදය ඉවත් කිරීමෙන්; සහ

(5) (ඇඉ) ඡේදයේ "1982 අංක 17 දරන සමාගම් පනත" යන වචන වෙනුවට "2007 අංක 7 දරන සමාගම් පනත" යන වචන ආදේශ කිරීමෙන්;

**ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම**

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ පහත දැක්වෙන අතුරු විධානය ඇතුළත් කිරීමෙන්:–

"එසේ වුව ද, මෙම නීතිය අදාළ වන තැනැත්තකු විසින් 4අ වගන්තිය ප්‍රකාරව ස්වයංක්‍රීයව ඉලෙක්ට්‍රොනික වත්කම් ප්‍රකාශ පද්ධතිය හරහා නිසි බලධරයා වෙත වත්කම් හා බැරකම් ප්‍රකාශයක් භාරදී ඇති අවස්ථාවක දී, එම ප්‍රකාශය මෙම වගන්තියේ කාර්ය සඳහා යථා පරිදි භාර දී ඇති ලෙස සළකනු /සළකා බලනු ලැබිය යුතු ය."

(2) (2) වන උපවගන්තියේ "මාස තුනක් ඇතුළත" යන වචන වෙනුවට "එක් මාසයක් ඇතුළත" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(3) 3 වන උපවගන්තියට ඉක්බිතිව ම, 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"(4) ඉහත (3) වන උපවගන්තිය ප්‍රකාරව වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගොනු කිරීමෙන් පසුව, මෙම නීතිය අදාළ වන යම් තැනැත්තකු විසින්, ඊළඟ ප්‍රකාශ ගොනු කිරීමේ දිනයට පෙරාතුව එම තැනැත්තාගේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රමාණය රුපියල් මිලියන දහයකට වැඩි ප්‍රමාණයකින් වෙනස්වීමේ බලපෑමක් ඇත්තා වූ පරිදි යම් ගනුදෙනුවක හෝ සමුච්චිත ගනුදෙනුවල යෙදී සිටින අවස්ථාවක දී, මෙම පනත පැනවීමේ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් එම මිලියන දහයක සීමාව සපුරාලීමෙන් පසුව මාස එකක කාලසීමාවක් ඇතුළත එම තැනැත්තා විසින් අතිවිශේෂ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගොනු කරනු ලැබිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) දැනට පවතින 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස අංක යෙදීමෙන්;

(2) එහි (අ) ඡේදයේ (ii) වන උපඡේදයේ "නියෝජ්‍ය අමාත්‍යවරයන් විසින්" යන වචන වෙනුවට "අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් වන අමාත්‍යවරුන් , අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:–

"(අඅ) ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ කථානායක ධුරය වෙතද;"

(4) එහි (එඅ) ඡේදයේ (i) වන උපඡේදයේ "1981 අංක 20 දරන සංවර්ධන සභා (ඡන්ද විමසීම්) පනත" යන වචන ඉවත් කිරීමෙන්;

(5) එහි (එඅ) ඡේදයේ (ii) වන උපඡේදයේ "1981 අංක 20 දරන සංවර්ධන සභා (ඡන්ද විමසීම්) පනත" යන වචන ඉවත් කිරීමෙන්;

(6) එහි (එඇ) උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(7) එහි (එඈ) උපවගන්තියේ "1982 අංක 17 දරන සමාගම් පනත යටතේ" යන වචන වෙනුවට "2007 අංක 7 දරන සමාගම් පනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(8) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, 4 වන වගන්තියේ (2) වන උපවගන්තිය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:–

"(2) මෙම නීතිය අදාළ වන යම් තැනැත්තකු විසින් ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික වත්කම් හා බැරකම් ප්‍රකාශ පද්ධතිය හරහා ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, එම ප්‍රකාශය ලැබී සති දෙකක කාලසීමාවක් ඇතුළත බලධරයා විසින් එම ප්‍රකාශය එකී පද්ධතිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියට 4අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 4අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික වත්කම් හා බැරකම් ප්‍රකාශ පද්ධතියක් පිහිටුවීමේ වගකීම

4අ. (1) අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් මේ පනත බලාත්මක වන දින සිට මාස 18 ක කාලසීමාවක් ඇතුළත ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික වත්කම් හා බැරකම් පද්ධතියක් පිහිටුවන ලැබිය යුතු අතර එම පද්ධතිය සඳහා –

(අ) වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉලෙක්ට්‍රොනික ලෙස භාරදීමට හැකියාව ලැබේ;

(ආ) 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව අවස්ථාවෝචිත වත්කම් හා බැරකම් ප්‍රකාශ භාරදීමට හැකියාව ලැබේ;

(ඇ) ප්‍රකාශයන් වල කාලානුරූප බව, නිවැරදි බව සහ සම්පූර්ණ බව ක්‍රමානුකූලව සත්‍යාපනය කිරීමට හැකියාව ලැබේ;

(ඈ) ස්වයංක්‍රීය පද්ධතිය හරහා අනාවරණය වන සැක සහිත ගනුදෙනු මත පදනම්ව සත්‍යාපනය කිරීමට හැකියාව ලැබේ;

(ඉ) ලැබෙන පැමිණිලි සත්‍යාපනය කිරීමට හැකියාව ලැබේ; සහ

(ඊ) බැංකු ගිණුම් අංක, හිමිකම් ඔප්පු අංක, මධ්‍යම තැන්පතුගාර පද්ධති අංක, ස්ථාවර තැන්පතු සහතිකපත්‍ර අංක, බැංකු තැන්පතු පෙට්ටි අංක ප්‍රකාශයෙන් ඉවත් කිරීමට යටත්ව හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් සමාන තොරතුරු ප්‍රකාශයෙන් ඉවත් කිරීමට යටත්ව එම ඉදිරිපත් කරන ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ වෙත මහජනතාව විසින් ප්‍රවේශ වීමට හැකියාව ලැබේ.;

(2) ඉහත කී (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද ස්වංක්‍රීය ඉලෙක්ට්‍රොනික වත්කම් ප්‍රකාශ පද්ධතිය හරහා නිසි බලධරයා වෙත වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගොනු කිරීම, 4 වන වගන්තියේ විධිවිධාන සළස්වා ඇති ආකාරයට පිළිවෙලින් වූ නිසි බලධරයාට අමතරව අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව වෙත වත්කම් හා බැරකම් ප්‍රකාශයක් භාරදීමක් ලෙස සළකනු ලැබිය යුතු ය; සහ

(3) 4අ වගන්තියේ (1) වන වගන්තියේ විධිවිධාන සළස්වා ඇති ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික වත්කම් ප්‍රකාශ පද්ධතිය පිහිටුවීමට පෙරාතුව වූ අන්තර්කාලසීමාව තුළදී, මේ පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව වූ ආකෘතියෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ අඛණ්ඩව ගොනු කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම (වත්කම් හා බැරකම් ප්‍රකාශය යොමු කිරීමේ බලය)

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (2) උපවගන්තියේ " අල්ලස් කොමසාරිස්වරයා" යන වචන වෙනුවට"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) උපවගන්තියට ඉක්බිතිව ම, 5 වන වගන්තියේ (2අ) සහ (2ආ) උපවගන්ති වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(2අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ කාලානුක්‍රමිකව විශ්ලේෂණය කර නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති පියවර ගනු ලැබිය යුතු ය.

(2ආ) 3 වන වගන්තිය ප්‍රකාරව භාරදෙන ලබන සියලු වත්කම් හා බැරකම් ප්‍රකාශ, බැංකු ගිණුම් අංක, හිමිකම් ඔප්පු අංක, මධ්‍යම තැන්පතුගාර පද්ධති අංක, ස්ථාවර තැන්පතු සහතික පත්‍ර අංක, බැංකු තැන්පතු පෙට්ටි අංක සහ අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් සමාන තොරතුරු ඉවත් කිරීමට යටත්ව එම වත්කම් බැරකම් ප්‍රකාශය ලැබීමේ දිනය සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත නිසි බලධරයා විසින් ස්වකීය අදාළ නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය. නිල වෙබ් අඩවියක් නොපවතින අවස්ථාවක දී, 3 වන වගන්තිය ප්‍රකාරව

ඉදිරිපත් කරනු ලබන සියලු වත්කම් හා බැරකම් ප්‍රකාශවල පිටපත්, ඉහත විධිවිධාන සලස්වා ඇති ප්‍රකාශයෙන් ඉවත් කිරීම්වලට යටත්ව, මහජනතාව විසින් ප්‍රවේශවීම පිණිස, නිසි බලධරයාගේ පරිශ්‍රයෙහි ගාස්තු අයකිරීමෙන් තොරව නිසි බලධරයා විසින් තබනු ලැබිය යුතු ය.

(3) එහි (3) වන උපවගන්තියේ "නිසි බළධරයා නියමිත ගාස්තුවක් ගෙවීම මත යම් තැනැත්තකුට යම් වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ගෙන්වාගෙන බැලීමේ අයිතිවාසිකම තිබිය යුතු අතර නියමිත වැඩිපුර ගාස්තුවක් ගෙවූ විට එම ප්‍රකාශයේ සහතික පිටපතක් ලබා ගැනීමේ අයිතිවාසිකම තිබිය යුතු ය" යන වචන වෙනුවට "නිසි බලධරයාට රුපියල් දෙසිය පනහක ගාස්තුවක් ගෙවීම මත යම් තැනැත්තකුට, මේ වගන්තියේ (2ආ) උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති ප්‍රකාශයන් ඉවත් කිරීම්වලට යටත්ව මේ පනතේ 3 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයක සහතික පිටපතක් ලබා ගැනීම සඳහා අයිතිවාසිකමක් තිබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (3) වන උපවගන්තියේ "උපවගන්තිය" යන වචනය වෙනුවට "වගන්තිය" යන වචන ආදේශ කිරීමෙන්;සහ

(5) එහි (3) වන උපවගන්තියේ "4 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "4 වන වගන්තිය හෝ 4අ වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම (අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත අතිරේක තොරතුරු කැඳවීම සඳහා බලය පවතින බව)

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "අල්ලස් කොමසාරිස්වරයාට" යන වචන වෙනුවට "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට" යන වචන ආදේශ කිරීමෙන්;

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (4) සහ (5) වන උපවගන්ති ඉවත් කිරීමෙන්; සහ

(2) එහි (6) වන උපවගන්තියේ "අල්ලස් කොමසාරිස්වරයා" යන වචන වෙනුවට "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්;

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

8 (1) 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය, 4 වන වගන්තිය හෝ 4අ වගන්තිය ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකශයක් වෙත ප්‍රවේශය ලබාගෙන ඇති යම් රාජ්‍ය සේවකයකු විසින්, එම ප්‍රකාශය වෙනත් යම් තැනැත්තකු වෙත සපයා ඇති අවස්ථාවක දී, බැංකු ගිණුම් අංක, හිමිකම් ඔප්පු අංක, මධ්‍යම තැන්පතුගාර පද්ධති අංක, ස්ථාවර තැන්පතු සහතිකපත්‍ර අංක, බැංකු තැන්පතු පෙට්ටි අංක සඳහා කරන ලද සඳහන් කිරීම් සහ අමාත්‍යවරයා විසින් ප්‍රකශයෙන් ඉවත් කරන ලෙස නියම කරනු ලබන වෙනත් යම් තොරතුරු ඉහත කී වත්කම් හා බැරකම් ප්‍රකාශයෙන් ඉවත් කර ඇති බවට එම රාජ්‍ය සේවකයා විසින් සහතික විය යුතු ය.

(ප්‍රකාශයෙන් කරුණු ඉවත් කිරීම මඟින් රහස්‍යභාවය ආරක්ෂා කිරීම)

එසේ වුව ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ප්‍රකාශවල පිටපත් වලින් තොරතුරු ඉවත් කිරීම සඳහා හෝ යම් නීතිය බලාත්මක කිරීමේ අධිකාරියක් වෙත අපරාධ විමර්ශන කටයුතුවල කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශ පිටපත් වලින් තොරතුරු ඉවත් කිරීම සඳහා එම රාජ්‍ය සේවකයා වගකීමෙන් බැඳී නොසිටින්නේ ය.

(2) මේ වගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් රාජ්‍ය සේවකයකු, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, එම රාජ්‍ය සේවකයා රුපියල් ලක්ෂ දෙකක්

නොඉක්මවන දඩ මුදලකට හෝ වසර දෙකක කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ එම මුදල සහ බන්ධනාගාර කිරීම යන දෙකටම යටත් විය යුතු ය.

මේ වගන්තියේ "රාජ්‍ය සේවකයා" යන්නට 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය, 4 වන වගන්තිය සහ 4අ වගන්තිය යටතේ එවැනි වත්කම් හා බැරකම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇත්තේ යම් නිසි බලධරයකු වෙත ද, එම නිසි බලධරයා විසින් සේවයේ නියුක්ත කර ඇති යම් තැනැත්තකු අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "අල්ලස් කොමසාරිස්වරයා" යන වචන වෙනුවට "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක්" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ පහක්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිවම 9 වන වගන්තියේ (1අ) උපවගන්තිය වශයෙන් බලාත්මක විය යුතු පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"(1අ) (1) වන උපවගන්තියේ (ආආ) ඡේදය යටතේ වූ යම් නඩු පැවරීමේ කාර්යයක් සඳහා, පරස්පර විරෝධී තත්ත්වයක් ඔප්පු කරනු ලබන තෙක්, එම ප්‍රකාශ නොකරන ලද වත්කම් හෝ බැරකම් එම ප්‍රකාශයෙන් චේතනාන්විතව ඉවත් කරනු ලැබූ ලෙස උපකල්පනය කරනු ලැබිය යුතු ය."

(4) එහි (3) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (3) වන උපවගන්තියේ "රුපියල් පනහක්" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(6) එහි (5) වන උපවගන්තියේ "නීතිපතිවරයාගේ පූර්ව අනුමතය ඇතිව මිස" යන වචන වෙනුවට "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාව විසින් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව මිස" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (ආ) ඡේදයේ "නීතිපතිවරයාගේ පූර්ව අනුමතය" යන වචන වෙනුවට "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පූර්ව අනුමතය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (උ) ඡේදයේ "නීතිපතිවරයාගේ "යන වචනය වෙනුවට "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය ඉවත් කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම (2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන හැර, වෙනත් නීති අභිබවා මේ පනත බලපැවැත්විය යුතු බව)

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වගන්තියේ "මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුය" යන වචන වෙනුවට "2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ සඳහන් ව්‍යතිරේක සමගින් මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "වත්කම් හා බැරකම්" යන අර්ථ නිරූපනයේ "සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සපයන ලද" යන වචන වෙනුවට "සම්පූර්ණයෙන්ම හෝ කොටසක් සපයන ලද හෝ ප්‍රකාශක විසින් බැංකු ගිණුම්වල හෝ වෙනත් ආකාරයකින් දරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(1) "පළාත් පාලන ආයතන" යන අර්ථ නිරූපනයේ "සංවර්ධන සභාවක්" යන වචන ඉවත් කිරීමෙන්.

**15.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව